**මිනුවන්ගොඩ නගර සභාව**
**ගම්පහ දිස්ත්‍රික්කය**
**---------------------------**

1. මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
---------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 02 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 04 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 ජූනි 01 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
--------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට මිනුවන්ගොඩ නගර සභවේ මූල්‍ය තත්ත්වය හා එදිනෙන් අවසන් වර්ෂය හා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්
------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2007 වර්ෂයේ සභාවට ලැබී තිබූ රු.500,000 ක් වටිනා ට්‍රැක්ටරයේ අයිතිය සභාවට පවරාගෙන නොතිබූ අතර, වටිනාකම ප්‍රාග්ධනිත කිරීම කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව අතැති තොගය, පොත්පත් අනුව තොගයට වඩා රු.929,711 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ ගිවිසුම්වලට එළඹ නොමැති ව්‍යාපෘති තුනක වටිනාකම වූ රු.928,719 ක් 2015 දෙසැම්බර් 31 දිනට උපචිත කර තිබුණි.

1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම.
---------------------------------------

(අ) තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම.

---------------------------------------------

එකතුව රු.1,201,418 ක් වූ ගිණුම් විෂයයන් 05 ක් සඳහා ලේඛණ හා උපලේඛණ ඉදිරිපත් නොකිරීම නිසා ඒවා විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

(ආ) නොසැසඳූ පාලන ගිණුම්
-----------------------------
මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනට විවිධ ණයහිමි ගිණුමේ ශේෂය රු.6,902,137 ක් වූ අතර, උපලේඛණයේ ශේෂය රු.6,622,946 ක් වූයෙන් රු.279,191 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ) ලැබිය යුතු ගිණුම්
---------------------
1994 සිට අගරු වී ඇති චෙක්පත් වටිනාකම රු.30,590 ක් වුවත් එය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

1.3.3 නීති,රීති රෙගුලාසි විධිවිධානවලට හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්
-----------------------------------------------------------------------------------------------
පහත දැක්වෙන අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතු වරිපනම් බදු රු.7,833,832 ක්ද, බලපත්‍ර ගාස්තු රු12,550 ක්ද, කඩකුලී රු.664,235 ක්ද සහ මස් අලෙවිසැල් කුලී රු.363,333 ක්ද අයකර ගැනීම සඳහා නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 170 අ (2) වගන්තිය අනුව 2016 අප්‍රේල් 12 වනවිටත් පියවර ගෙන නොතිබුණි.

(ආ) 2002 සැප්තැම්බර් 30 දිනැති රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අංක 364(3) චක්‍රලේඛයේ 05 ඡේදය අනුව ආයතනය විසින් ගෙවනු ලබන රු.25,000 ට වැඩි එකතු කල අගය මත බදු ගෙවීම් සම්බන්ධ වාර්තාවක් විගණකාධිපතිවරයාට පිටපතක් සහිතව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ට යැවිය යුතු වුවද, 2015 ජනවාරි සිට දෙසැම්බර් දක්වා රු.290,567 ක් වූ බදු සම්බන්ධයෙන් විස්තර දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වෙත යවා නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය
-------------------------
2.1 මූල්‍ය ප්‍රතිඵල
------------------
ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්ථන වියදමට වඩා වැඩිවූ ආදායම රු.17,834,428 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්ථන වියදමට වඩා වැඩිවූ ආදායම රු.361,500 ක් විය.

2.2 ආදායම් පරිපාලනය
-------------------------
2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්
-------------------------------------------------------------------
සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|
| | | --------------------- | ----------------- | ------- | ----------------------- |
| | | | 000` | 000` | 000 ` |
| | | | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | | 9,710 | 9,884 | 10,206 |
| (ii) | බදු කුලී | | 17,978 | 18,281 | 1,215 |
| (iii) | බලපත්‍ර ගාස්තු | | 1,237 | 1,094 | 47 |
| (iv) | වෙනත් ආදායම් | | 11,756 | 37,886 | 1,627 |

2.2.2 වරිපනම් හා බදු

--------------------

ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්යේදී හිඟ වරිපනම් බදු ශේෂය රුපියල් ලක්ෂ 6.5 ක් වැඩිවී තිබුණි.

2.2.3 වෙනත් ආදායම්

-------------------

(i) සමාලෝචිත වර්ෂයේ හිඟ වෙනත් ආදායම් රුපියල් මිලියන 4.7 ක් සමුච්චිත අරමුදලට කපාහැර තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේ වෙනත් ආදායම් ඇස්තමේන්තු අගයට වඩා රුපියල් මිලියන 26 කින් වැඩිවී තිබුණි.

2.2.4 කඩකාමර බදු

-----------------

නගර සභාවට අයත් ප්‍රීඩම් පාක් (සණස) ගොඩනැගිල්ලේ කඩකාමර 02 ක පෙර ගෙවුම් මුදල් නොගෙවීම හේතුවෙන් කඩකාමර 02 සඳහා වූ රු.880,304 ක පෙර ගෙවුම් මුදලක් සභාවට අහිමි වී තිබුණි. එම කඩකාමර නැවත ටෙන්ඩර් කර ලබාදීමට කටයුතු කලයුතු වුවත්, 2016 අප්‍රේල් 18 වන දින වනවිටත් එසේ කර නොතිබුණි.

2.3 අධිභාර

--------

නගර සභා ආඥා පනතේ (255 වන අධිකාරය) 182 (1) වගන්තියේ විධිවිධාන යටතේ වගකිව යුතු පුද්ගලයින්ට එරෙහිව මවිසින් පනවන ලද අධිභාර අනුව 2015 දෙසැම්බර් 31 දිනට අයකර ගැනීමට තිබූ අධිභාරවල අගය රු.19,946 ක් විය.

2.4 ප්‍රමාණවත් අධිකාරි බලයකින් තහවුරු නොවූ ගණුදෙනු

---

සභාවට අයවිය යුතු වෙනත් ආදායම් හා අත්තිකාරම් (පෙර ගෙවුම්) රු.8,460,725ක්ද, සභාවේ කර්මාන්ත තැන්පතු හා ගෙවල් කුලී තැන්පතු රු.1,323,004 ක්ද, මිය ගිය සේවකයින්ගේ සේවක ණය රු.23,402 ක්ද පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතියකින් තොරව හා අයිතම් වෙන් වෙන්ව හඳුනාගැනීමකින් තොරව සමුච්චිත අරමුදලින් කපාහැර තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

---

3.1 මෙහෙයුම්/කළමනාකරණ අකාර්යක්ෂමතා

---

ස්ථාවර වත්කම් ලේඛනයට අනුව බුළුගහකුඹුර මීගමු පාරේ අංක 19 දරණ ස්ථානයේ පිහිටි රූඩ් 01 පර්චස් 6.25 ක් වූ මුළු ඉඩමෙහි එක් කොටසක් පොම්පාගාරයක් සඳහා භාවිතා කරන අතර, ඉතිරි කොටසෙන් ප්‍රමාණයක දීර්ඝ කාලීනව අනවසර පදිංචිකාරියක පදිංචි වී සිටියද ,1979 අංක 07 දරණ රජයේ ඉඩම් සන්තකය ආපසු ලබා ගැනීමේ පනතේ විධිවිධාන ප්‍රකාරව අනවසර පදිංචිකරු ඉවත්කර සන්තකය ලබා ගැනීමට විගණිත දිනය වූ 2016 මාර්තු 29 දින වනවිටත් සභාව කටයුතු කර නොතිබුණි.

3.2 සන අපද්‍රව්‍ය කළමනාකරණය

---

(අ) පළාත් සභා රීතිවලට පටහැනිව කටයුතු කිරීම

---

2008 ජූලි 30 දිනැති අංක 1560/6 ගැසට් පත්‍රයේ පළ කර ඇති 2008 අංක 01 දරන "සන අපද්‍රව්‍ය කළමණාකරණ රීති" සියලුම පළාත් පාලන ආයතන ක්‍රියාත්මක කළ යුතු බවට 2010 දෙසැම්බර් 21 දිනැති පළාත් පාලන කොමසාරිස්ගේ (බස්නාහිර පළාත) අංක දරණ එල්ජීඩී/05/08/පොදු/වෙළුම ලිපියෙන් දැනුම් දී තිබුණද,නගර සභාව ඒවා ක්‍රියාත්මක කිරීමේදී රීති මාලාවේ 18(1), 19,20,21(1), 22,54 හා 59 යන රීතීන් අනුගමනය කර නොතිබුණි.

(ආ) ගාස්තු අය නොකිරීම

---

සමාලෝචිත වර්ෂය තුළදී කසල බද්දක් අය කළ යුතු ස්ථාන කිසිවක් හඳුනා ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි.එසේම නගර සභා සීමාව තුළ ව්‍යාපාර බදු අය කරනු ලබන ගබඩා සංකීර්ණයක්,දිසිදි පොල් නිෂ්පාදන ආයතනයක්,සුපිරි වෙළඳසැල් ව්‍යාපාර 02 ක් හා හෝටල් විශාල ප්‍රමාණයක් තිබුණද ඒවායින් කසල ගාස්තු අය කර ගැනීමට නගර සභාව අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි.

3.3 මහජන සෞඛ්‍ය පීඩා වැලැක්වීම

---

2012 ජූනි 27 දිනැති අංක 1764/14 ගැසට් නිවේදනයේ පළකර ඇති 2012 අංක 03 දරණ මහජන සෞඛ්‍ය පීඩා වැලැක්වීමේ ප්‍රඥප්තිය ප්‍රකාරව, බස්නාහිර පළාතේ මහජන සෞඛ්‍ය නගා සිටුවීම සහ සංරක්ෂණය කිරීම සඳහාත්, මදුරුවන් මගින් ඇතිවන පීඩා හෝ රෝග වැලැක්වීම සඳහාත්, අනෙකුත් මහජන පීඩා මැඩ පැවැත්වීම සඳහාත් ඊට සම්බන්ධ හෝ අනුශාංගික කරුණු සඳහා විධිවිධාන සැලසිය යුතු වුවත්, නගර සභාව ඒවා ක්‍රියාත්මක කිරීමේදී ප්‍රඥප්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

4. යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

-----------------------------------------

අයවැය පාලනය

------------------------

සමාලෝචිත වර්ෂයේ වැය ශිර්ෂ 53 ක් යටතේ ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය වූ රු.104,600 ක් මුළුමමන්ම ඉතිරිව තිබුණි.

5. පද්ධති හා පාලන

---------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාපතිවරයාගේ අවධානයට යොමුකර ඇති අතර, පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ආදායම් පරිපාලනය.

(ආ) ණයහිමි/ණයගැති පාලනය

(ඇ) තොග පාලනය